**කයිට්ස් ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**
**------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 20 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 29 දින හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 සැප්තැම්බර් 06 දින සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයෙන් විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, කයිට්ස් ප්‍රාදේශීය සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවට අයත් නොවූ ක්‍රිඩා පිට්ටනියෙහි වටිනාකම රු. 5,925,000 ක් ඉඩම් හා ගොඩනැගිලි වටිනාකමට ඇතුළත් කර තිබූ බැවින් වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | සභාවට පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවති. | ක්‍රිඩා පිට්ටනිය පිහිටි ඉඩමෙහි අයිතිය සභාවට පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතු වේ. |
| (ආ) | අයිතිය නොපැවරූ වටිනාකම රු.15,121,600 ක්වූ වාහන 04ක්, මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබූ බැවින් වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | වාහන 04ක් පමණක් මේ දක්වා අයිතිය පවරා ගැනීමකින් තොරව පැවතුණි. | වාහනවල අයිතිය සභාවට පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතු වේ. |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය | සභාව විසින් වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | ඊළඟ වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරනු ලැබේ. | අදාළ පනතේ උපදෙස්වලට අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | (i) III පරිච්ඡේදයේ 32 වගන්තිය | වරිපනම් හා බදු තක්සේරු කිරීම සභාව විසින් සිදු කර නොතිබුණි. | නැවත තක්සේරු කිරීම් කටයුතු සිදු කෙරෙමින් පවති. | අදාළ පනතේ විධිවිධානවලට අනුව වරිපනම් හා බදු තක්සේරු කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ. |
| | (ii) X පරිච්ඡේදයේ 193 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම සහ වියදම් සම්බන්ධ වියදම් අයවැය සමග සසඳා තිබුණත්, විචලනයන් සඳහා හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ඉදිරිපත් කරනු ලැබේ. | අදාළ පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | කොන්ත්‍රාත්කරුවන්ට ආපසු ගෙවිය යුතු ඇප මුදල් රු.221,721ක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඇප මුදල් ආපසු ගෙවීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | ආපසු ගෙවිය යුතු ඇප මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය | | | |
| | 2018.01.24 දිනැති අංක 05/2018(1) (එ) දරන චක්‍රලේඛය මගින් | ප්‍රජාව/ප්‍රතිලාභීන් සඳහා අපේක්ෂිත මහජන සේවාවන් ලැයිස්තුව | මහජන සේවාවන් ලැයිස්තුව සකස්කර ප්‍රදර්ශනය කිරීමට | චක්‍රලේඛ ප්‍රකාරව මහජන සේවාවන් ලැයිස්තුව සකස් කිරීමට ක්‍රියාමාර්ග ගත |

| | | | | |
|---|---|---|---|---|
| | සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛය | සකස්කර ප්‍රදර්ශනය කර නොතිබුණි. | කටයුතු කර ඇත. | යුතුවේ. |
| (ඉ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය අංක 30/2016 දරන 2016 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛය | සභාව සතු වාහන 03 ක ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කර නොතිබුණි. | ඉන්ධන දහනය පරීක්ෂා කිරීමේ කටයුතු කරනු ලැබේ. | අදාල චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුවේ. |
| (ඊ) | අනෙකුත් චක්‍රලේඛ 2018.07.19 දිනැති අංක 2018/e පළාත්පාලන -01 දරන පළාත්පාලන චක්‍රලේඛය | ප්‍රජාවට අන්තර්ජාලය මාර්ගයෙන් සේවාවන් ලබාගැනීමේ පහසුකම් සලසා දි නොතිබුණි. | අන්තර්ජාලය මාර්ගයෙන් ජනතාවට සේවාවන් සලසා දිමට කටයුතු කරනු ලැබේ. | අදාල චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රජාවට අන්තර්ජාලය මාර්ගයෙන් සේවාවන් ලබාගැනීමේ පහසුකම් සලසා දිමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7, 905,030 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,565,468 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | - | 250 | - | - | - | - |
| කුලී | 2,776,400 | 2,948,555 | 37,568 | 2,921,300 | 2,233,867 | 8,000 |
| බලපත්‍ර ගාස්තු | 540,555 | 479,295 | - | 451,650 | 448,762 | - |
| වෙනත් ආදායම් | 48,196,898 | 44,595,588 | - | 44,502,876 | 37,565,500 | 47,450 |
| | 51,513,853 | 48,023,688 | 37,568 | 47,875,826 | 40,248,129 | 55,450 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ රැස්කළ ආදායම රු. 40,248,129 ක් වුවත්, 2019 වර්ෂයේ රැස්කළ ආදායම රු.48,023,688 කින් වැඩි වීම නිසා 2018 වර්ෂය සමඟ සැසඳීමේදී 2019 වර්ෂයේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය රු.7,775,559 කින් වැඩි වී තිබුණි. කෙසේ වෙතත්, ආදායම් ලැයිස්තුගත කිරීමට සභාව අපොහොසත් වි තිබුණි. | සටහන් කර ගන්නා ලදි. | ලැයිස්තුගත කළ ආදායම් මූලාෳ ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. |

**2.2.3 උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු**

**(අ) උසාවි දඩ මුදල්**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2019 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු.147,016 ක් ලැබිය යුතුව තිබුණි. | **හිඟහිටි උසාවි දඩ මුදල්** ලබාගැනීමට කටයුතු කරමින් පවතී. | හිඟහිටි උසාවි දඩ මුදල් නියමිත කාල පරාසය තුළ අයකර ගැනීමට සභාව විසින් කටයුතු කළ යුතු වේ. |

**(ආ) මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2019 දෙසැම්බර් 31 මුද්දර ගාස්තු රු.324,500 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟහිටි මුද්දර ගාස්තු ලබාගැනීමට කටයුතු කරමින් පවතී. | හිඟහිටි මුද්දර ගාස්තු නියමිත කාල පරාසය තුළ හිඟ මුදල් අයකර ගැනීමට සභාව විසින් කටයුතු කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තියට අනුව, සභාව විසින් මහජන සෞඛ්‍ය උපයෝගී සේවා සහ පොදු මංමාවත් සහ ජනතාවගේ සුබවිහරණය, පහසුකම් සහ සුහසාධනය ආදිය සභාව විසින් ඉටු කළ යුතු කාර්යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත සඳහන් පරිදි විය.

(අ) අතුරු ව්‍යවස්ථා
-----------------

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව මූලික කරුණු 30ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා ස්ථාපිත කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට ක්‍රියාමාර්ග ගතයුතු වේ. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම
-------------------

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරිමට කටයුතු කරනු ලැබේ. | අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. |

(ඇ) කාර්යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්
---------------------------------

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.1,366,000ක් වූ ක්‍රියාකාරකම් 06ක් ආරම්භ කර තිබුණත් නියමිත කාලයේ අවසන් කර නොතිබූ බව නිරීක්ෂණය විය. | නියමිත කාලයේ අවසන් කිරීමට කටයුතු කළ යුතුවේ. | කාර්යයන් අවසන් කිරිමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුවේ. |

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
-----------------------------

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2019 වර්ෂයේ ඝන අපද්‍රව්‍ය ඉවත් කිරිමේ වියදම් සඳහා රු. 767,007ක් වැය කර තිබුණත්, ඝන අපද්‍රව්‍ය ඉවත්කිරිමේ කාර්යයන් ප්‍රාදේශීය සභාව විසින් ඵලදායි ආකාරයෙන් සිදු කර නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය ඉවත්කිරිමේ කාර්යයන් ඵලදායි ආකාරයෙන් ඉදිරියේදි සිදු කරනු ලැබේ. | ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම විධිමත් අයුරින් සිදුකළ යුතු වේ. |

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ii) | විවෘත වාහනවලින් කසළ රැස්කරන බැවින් මාර්ගය පුරා අපද්‍රව්‍ය වැටී තිබුණි. | සභාවේ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ආවරණය කළ වාහන නොමැති නිසා, ආවරණය කළ වාහන භාවිතා කළ නොහැකි නමුත් ඵලදායි ආකාරයෙන් අපද්‍රව්‍ය බැහැර කිරීමේ කටයුතු සිදුකෙරේ. | ඝන අපද්‍රව්‍ය නියමිත ආරක්ෂිත ක්‍රමවේදයන් භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (iii) | ඝන අපද්‍රව්‍ය කාර්යයන්වල යොදවනු ලබන සෞඛ්‍ය කම්කරුවන්ට කාලයෙන් කාලයට සිදු කළ යුතු වෛද්‍ය පරීක්ෂණයන් සභාව විසින් සිදුකර නොතිබුණි. | ඉදිරි අනාගතයේදී වෛද්‍ය පරීක්ෂණ සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. | සෞඛ්‍ය කම්කරුවන්ට වෛද්‍ය පරීක්ෂණයන් ප්‍රාදේශීය සභාව විසින් නියමිත කාලයේ සිදු කළ යුතු වේ. |

**(ඉ) පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහා මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මදුරුවන් බෝවීම වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග කරනු ලැබේ. | පරිසරය සුරැකීම සඳහා නියමිත ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතු වේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතුව පවතින සුසාන භූමි 16ක් සඳහා සභාව විසින් සංවර්ධන කාර්යයන් සිදු කර තිබුණත්, සුසාන භූමි බදු අය කර නොතිබුණි. | සුසාන භූමි බදු අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | සුසාන භූමි බදු අයකර ගැනීමට සභාව විසින් අවශ්‍ය කටයුතු කළ යුතු වේ. |
| (ආ) | වරිපනම් හා බදු තක්සේරු කිරීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි. | තක්සේරු කිරීමේ කටයුතු සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. | වරිපනම් බදු තක්සේරු කටයුතු සභාව විසින් සිදු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ඇ) | ප්‍රාදේශීය සභාව මහජන සේවාවන් ලැයිස්තුගත කර ප්‍රදර්ශනය කර තිබුණද, එහි සඳහන් කරුණුවලට පටහැනිව මහජනතාවට සලසා තිබූ සේවාවන් කාල ප්‍රමාදයක් සහිතව සිදු කර තිබුණි. | තොරතුරු සහ ලේඛන නියමිත අයුරින් ඉදිරිපත් නොකළ අවස්ථාවලදී පමණක් ප්‍රමාදයන් සිදු වේ. | මහජනතාවට සැලසිය යුතු සේවාවන් නියමිත කාලයේ සැලසිය යුතු වේ. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් නියමිත පරිදි මානව සම්පත් ලබාගෙන යොදවා නොතිබු බැවින්, එවැනි මානව සම්පත් 20 ක් විසින් ඉටු කළයුතු සේවාවන් ප්‍රමාදවී තිබු බව විගණනයේදි නිරීක්ෂණය විය. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කෙරේ. | තනතුරු පුරප්පාඩු නියමිත කාලයේ පිරවීමට සභාව විසින් කටයුතු කළ යුතු වේ. |

### 3.4 වත්කම් කළමනාකරණය

#### 3.4.1 නඩත්තුව හා අලුත්වැඩියා නොකිරීම

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් භාවිතා කරන වාහන 09ක් අලුත්වැඩියා කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. | වාහන අලුත්වැඩියා සිදුකිරීමට සභාව විසින් අවශ්‍ය කටයුතු කළ යුතු වේ. |

#### 3.4.2 පවරා නොගත් වත්කම්

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතුව රු.50,070,600ක් වටිනා දේපළ 22ක් සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කරමින් පවති. | දේපළ අයිතිය සභාවේ නමට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සභාව විසින් සිදුකළ යුතු වේ. |
| (ආ) | සභාවට සතු වාහන 04ක අයිතිය සභවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කරමින් පවති. | වාහනවල අයිතිය පවරා ගැනීමට සභාව විසින් කටයුතු කළ යුතු වේ. |

### 3.4.3 නිෂ්කාර්ය වත්කම්

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සභාවට අයත් දේවාරාදම් බෝට්ටුව වසර 05 ක් පුරා නිෂ්කාර්යව පැවතුණි. | බෝට්ටුව ලියාපදිංචි කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට නොහැකිව ඇත. | නිෂ්කාර්යව පවතින බෝට්ටුව භාවිතා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. |
| (ආ) සභාව සතු නවීන වෙළෙඳපොළ කඩකාමර සංකීර්ණයේ කඩකාමර 23ක් කුලියට ලබානොදී නිෂ්කාර්යව පැවතුණි. | අදාල ව්‍යාපාරික ස්ථාන කුලියට ලබාගැනීම සඳහා කිසිවෙකුත් ලංසු ඉදිරිපත් කර නොමැත. | කඩකාමර කුලියට ලබාදීමට සුදුසු ක්‍රියාමාර්ග සභාව විසින් ගෙන ඇත. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ පුනරාවර්තන වියදම් හා තථ්‍ය වියදම් අතර ප්‍රමාණාත්මක විචලනයක් නිරීක්ෂණය වීම නිසා මෙය වියදම් ඇස්තමේන්තුවේ අකාර්යක්ෂමතාවය හෙළිදරව් කෙරුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතු වේ. |